ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 ජනවාරි 21 සඳුදා
05 වෙළුම - 12 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය



# සාන්ත සෙබස්තියන් මුනිඳුන් සමරණ මංගල්‍යය සමය උදා වුනි !

ලමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# අපේ කතෝලික ගත් කරුවන් ඔබත් හඳුනාගත යුතුයි.

**( අද - හියුබත් දිසානායක )**

## ආදරණීය දුවේ පුතේ...

මෑත කාලීන අපේ කිතුනු සාහිත්‍යය ගැන මඳක් විමසිලිමත් වුවහොත් අපට ඒ සඳහා දයක වුනු බොහෝ දෙනෙකු මතකයට නංවා ගත හැකියි. විශේෂයෙන්ම 20 වන ශතවර්ෂයේ මුල භාගය තුළත්, අග භාගය තුළත් කිතුනු සාහිත්‍යයට, කලාවට අත හිත දුන් බොහෝ දෙනෙක් ගැන කියන කතා අපේ සවන් වැකුණත් ඉන් අතළොස්සක් ගැන පමණයි, බොහෝ විට පුන පුනා කියවෙන්නේ. ඒ නිසා, සමහර විට, ශ්‍රී ලාංකේය කිතුනු සාහිත්‍යයටත්, සිංහල සාහිත්‍යයටත් සේවය දේවා ලූ අපූර්ව කිතුනු සාහිත්‍යධරයින් පිළිබඳව සොයා යෑම මඳක් පසුගාමී වෙලා තියෙනවා. නමුත් මේ හා සම්බන්ධ සෑම කෙනෙක්වම සිහිපත් කිරීම අපේ යුතුකමක් වෙනවා.

ආදර දුවේ, පුතේ, එයට බලපාන තවත් ප්‍රධාන හේතුවක් තිබෙනවා. මන්ද, ''කිතුනුවෙක් නම් සිංහල කම තුළ ජීවත් නොවන්නෙක් '' යන මතය දැන් කාලාන්තරයක් තිස්සේ සමහර අන්තගාමීන් විසින් සමාජයේ සංස්ථාගත කරන්නට නිහීන උත්සහයක් දරනවා. හරියට කිතුනුවෙක් වීම මේ රට තුළ විජාතිකයකු සේ ජීවත් වන්නෙක් යන සාවද්‍ය මතය මේ අන්තවාදීන් නිරන්තරයෙන්ම සමාජගත කරන්නට බොහෝ සෙයින් උත්සහ ගත්තත් මෑත අතීතයේ ජීවත්වූ අපේ කිතුනු කලාකරුවන් ඒ සියල්ල තමන්ගේ පෑනෙන් නිෂ්ප්‍රභ කොට තිබෙනවා. ඒ කලාකරුවන් අතරින් ගෞරවයෙන් සිහිපත් කළ යුතු උතුම් කලා කරුවෙක් ගැන අද මේ සටහන තුළින් ඔබත් එක්ක කතා කරන්න උත්සහ කරනවා.

ආදර දුවේ, පුතේ, ලිවීම කරන්නට බොහෝ දෙනෙකුට හැකි වුවත් ලේඛක කම පහසුවෙන් ඉටු කළ හැකි කටයුත්තක් නොවේ. ගත්කරු කමත් එලෙසමයි. නමුත් මේ කාර්යයන් දෙකම ඉටු කළ මෙරට කිතුනු සාහිත්‍යකාමීන් අතර ප්‍රමුඛ තැනක් හිමිකර ගනු ලබනට සමත් වූවෙක්, මහා කවි හියුබත් දිසානායක. කිතුනු මහා සංගීතඥ සුනිල් සාන්තයන්ගේ ආභාෂයත්, කිතුනු සාහිත්‍යධර අතිගරු මෝසස් මාහිමියන්ගේ ඇසුරත් ලැබූ හියුබත් දිසානායකයන් උපත ලැබුවේ ජා-ඇල වැලිගම්පිටිය ප්‍රදේශයේයි. ඔහු කවි කලාවට නැඹුරු වූයේ කුඩා අවධියේ පටන්මයි. මේ අද්විතීය හැකියාව නිසාම පසු කලක කවියකු, ගීත නිබන්ධක යෙකු, පුවත්පත් කලා වේදියකු හා ගත් කරුවකු වශයෙන්ද හියුබත් දිසානායකයන් ප්‍රසිද්ධියට පත් වුවා පමණක් නොව අදටත් එකී නාමය තබා ගන්නට වාසනාවක්ද ලබා තිබෙනවා. ඔහුගේ පළමු කාව්‍ය ග්‍රන්ථය වූයේ ''කැලෑ මල'' යි. හියුබත් දිසානායකයන්ගේ අපූර්ව හැකියාව වූයේ නිවැරදිව සිතීම තුළ එය නිවැරදිව ලියන්නට යොමු කරවීමයි. කැලෑ මලෙන් පසුව තවත් රස ගැන්වූ කෘති ගණනාවක්ම මොහු අතින් ලියැවුනා. ''මල් සුවඳ'', ''වියෝ වියරුව'' ''දෝංකාරය'' , ''අනුරාව'' ආදී ගැදි- පැදි නිබැඳුම් ඉතාමත් ජනප්‍රිය වුනා. දෙවිඳුන්ගේ ආදරය අපූර්වත්වයෙන් සොබා දහමට කැටිකරලා ඒ තුළින් උපන් ලාලිත්‍යම සාහිත්‍ය රස ගන්වන්නට හියුබත් දිසානායකයන් තුළ උපතෙන්ම හිමිවී තිබූ සහජ දක්‍ෂතාවය නොඅඩුව තිබුනා.

කුමාරතුංග මුනිදස ශූරීන්ගේ ගුරු කුලයෙහි ප්‍රබල සාමාජිකයකු වූ හියුබත් දිසානායක නිරන්තරයෙන්ම නිවැරදිව බස ලියන්නට දැක්වූයේ පුදුමාකාර උනන්දුවක් , ඒ වගේම සිය ගණනකට ආසන්න පොත් සංඛ්‍යාවක් දිසානායකයාණන් ලියා තිබෙනවා. ඒවා අතර ගද්‍ය පද්‍ය නිබන්ධන , චරිත කථා, නව කථා, අනුවාද, ළමා පොත්, උපදේශක ග්‍රන්ථ හා සංස්කරණද අඩංගු වෙනවා.

ආදර දුවේ, පුතේ, ඔබ අහලා තියෙනවා නේද? මේ ජනප්‍රිය ගීතය. ''කෝකිලයන්ගෙ කෝකිල නාදේ.'' මහා සංගීතඥ සුනිල් සාන්තයන් ගායනා කරන ''කෝකිලයන්ගේ ගීතයත්, අත්තනගළු වැලපිල්ල'' යන ගීතයත් ලියා ඇත්තේ හියුබත් දිසානායකයන් විසින්මයි. බටහිර සාහිත්‍ය කරණයේ ආභාෂය තුළ ඔහු ළමා පොත් ගණනාවක්ම රචනා කොට තිබෙනවා. සුප්‍රකට ළමා නාට්‍ය පෙළක්ද ඔහු විසින් දයාද කොට දී තිබෙනවා. ගීතිකා ගණනාවක්ම ඔහු විසින් රචනා කොට තිබෙනවා.

ආදර දුවේ, පුතේ, ඥනාර්ථ ප්‍රදීපය කතෝලික පුවත් පතින් සිය ලේඛන දිවිය ආරම්භ කළ හියුබත් දිසානායකයන් කිතුනුකම සිංහල කමට බාධාවක් නොවන බවත්, කිතුනු කමත්, සිංහල කමත්, දෙකක් නොව එකක් විය යුතු බවත් සිතින් පමණක් නොව සිය කුසලතාවයෙන්ද අපූරුවට කළ විද්වතෙක්. ඉතිං , අද ඔබ දැන හඳුනාගත් මේ අඳීන කතෝලික ලේඛකයා ගැන තවත් තොරතුරු එකතු කරන්න. විස්තර කියවා දැනගන්න. මෑත කාලීන අපේ කතෝලික ලේඛකයන් ගැන තවත් කරුණු ගවේෂණය කරන්න

**ඔබට ජේසු පිහිටයි.**

සංස්කාරක

**ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා**

# තුන්කාල ආරාධනාව සහා ත්‍රින්දදිය...



“අලුත් ඉරක් පායලා, අලුත් දිනක් උදවෙලා” ඇත්තටම හිමිදිරි උදෑසන අවදිව පාඩම් කරන සිසුවකුට මේ යැදුම හා ගී රාවය කෙතරම් ආශිර්වාදයක්දැයි ඔබට අමුතුවෙන් කිවයුතු නැත. සිසු දරු දැරියන්ගේ පහන් සිත් කුලු ගන්වන මේ සුමිහිරි භාවනාත්මක වින්දනය කෙතරම් අගනේදැයි වියපත් වැඩිහිටියකු වූ මට තදින් දැනේ. අප අකුරු කළේ සති දෙකකට වරක් ඉරුදින දිව්‍ය පූජාව පැවැත්වීමට පමණක් පූජා ප්‍රසාදි තුමකු පැමිණෙන දූප්පත් පල්ලියක් යාබදව පිහිටි කතෝලික කනිෂ්ඨ පාඨශාලාවකය.

ඒ වන විට පාසල් සිසුන්ට දිවා ආහාරය ලෙස ලැබුනේ කංකුන්, පරිප්පු, මුංඇට, හාල් මැස්සන් හෝ තම්පලා හොදි සමග පාන් පෙත්තකි. දවල් එකොළහමාර වන විට මේ “පාන් කෑල්ල” “එය පාන්” රාත්තලකින් 1/8 කි. සෑම ළමයෙකුම ඉදිරියේ මේසය මත තැබේ. ලොකු අයියලා සහ අක්කලාද විසින් ඊලඟට පාන් කෑල්ල මතට හොදි පොල්කටු හැන්දකින් එකක් බැගින් බෙදා දෙනු ලැබේ. එතැන් සිට අපේ නෙත් සිත් පාන් කෑල්ලෙන් ඉවත යන්නේ නැත. දුම් දමන හොද්දෙන් නැගෙන සුවඳ නාසය තුළින් රිංගා ගොස් සිත තුළ පුදුම ගිජුබවක් ඇති කරයි. මොහොතකින් දෙකකින් “සංක්‍රිස්තියන් මාමා” පල්ලියේ සීනුව හඬවයි. ඒ සමගම පාසලේ සීනුවද හැඬවේ. සියලුම ළමයි වහා නැගී සිටිති. සියල්ලෝ ශබ්ද නගා කියති.

පිතාගේත් පුත්‍රයාගෙත් ස්ප්‍රීන්තු සාන්තුගෙත් නාමෙන් , ආමෙන්, ස්වාමින්ගේ දූතයා මරිය තුමියට සැල කළේය. කුඩා කාලයේදී අප බොහෝ දෙනෙකුට මේ “සැල කළේය” යන්න හරිහැටි තේරුනේ නැත. එබැවින් අපට වඩා හොඳින් තේරුනු “සැර කළේය” යනුවෙන් උච්චාරණය කළෙමු. බොහෝ දෙනෙකුගේ හඬ මැද අපෙ වැරැද්ද කිසිවකුගේ සැලකිල්ලට යොමු වුනේ නැත. එහෙත් මේ සිද්ධියේ ඇති වඩාත්ම වැදගත්ම කරුණ වන්නේ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත හා ජීවිතය පිළිබඳ වඩාත් වැදගත් සංක්ෂිප්තයක් කුඩාකල සිටම අප සිත්තුළ සනිටු වහන් කිරීමය.

එහෙත් අද සිසුන් මේවා පුරුදු පුහුණු නොකළ නිසාදෝ ඒ පිළිබඳ ප්‍රබල හැඟීම් ඔවුන් තුළ නැත. එවැනි අවස්ථාවක් මා මුලින් සඳහන් කළ හිමිදිරි උදෑසන තිරින්දදියේ හඬ තුන්කාල ආරාධනාව අපේ දරුවන්ට සවන් දෙන්නට සලස්වන්නේ නම් ඒ කෙතරම් මනෝඥද? එද නොතිබූ ශබ්ද විකාශන පහසුකම් අද සෑම දේවස්ථානයකටම පාහේ ඇත. ඩිජිටල් තාක්‍ෂනයෙන් අනූන එවැනි යන්ත්‍ර පද්ධතීන්ගෙන් දේවස්ථානය සන්නද්ධ කිරීමට ගරු පියවරුද උනන්දු වෙති. එමගින් පියතුමාගේ හඬටද ගීතිකා කණ්ඩායමේ ගැයුමටද මනා ගරු ගාම්භීර බවක් ලැබේ.

ඒ වගේම එම පහසු කම් තුන්කාල ආරාධනාවටද ලබා දිය හැකි නම් එය කෙතරම් අගේදැයි කිවයුතු නැත. දැනටමත් එසේ කරන තැන් හා අවස්ථාද තිබේ. මම ඒ මිහිරි වින්දනය ගැන මුලින් කීවෙමි. එය සෑම දේවස්ථානයකින්ම අනුගමනය කරන්නේ නම් ඉතා මැනවයිද මෙහිලා සඳහන් කරමි.

✍ පමුණුගම - එන්.එම්. පෙරේරා



කට්ටුව මීසමේ පූජා සහයක දරුවන්ගේ තේවාවර ප්‍රදානෝත්සවය පසුගියදා කට්ටුව ශු. ෆැන්සිස් සාලෙස් මුනිඳුන්ගේ දේවස්ථානයේදී මීසම් සේවක ගරු රුවන් රිඩ් ලියනගේ පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවත්විණි. එදින ළමුන් 24 දෙනෙකු තේවාවරය ලබාගත් අතර, නවක පූජා සහයක දරුවන් ලෙස ළමුන් 5 දෙනෙකු පූජා ඇඳුම් පැළඳි අතර, ළමුන් 17 දෙනෙකු පදක්කම් ලබා ගත්හ. දේව මෙහෙයෙන් පසු පූජා සහයක දරුවන් ගරු පියතුමන් සමග ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයා රුවකට පෙනී සිටි අයුරු. **බෙනඩික් පෙරේරා- කට්ටුව**

## පුංචි අපේ කියුම් කෙරුම්



කන්දාන ද මැසිනොද් විදුහලට 2013 පළමු ශ්‍රේණිය සඳහා පැමිණි නවක සිසුන්ව පිළි ගැනීමේ උත්සවය විදුහල්පති ගරු බර්ට්‍රම් පෙරේරා සහෝදරතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා ප්‍රාථමික අංශ එළිමහන් රංග පීඨයේදී පැවැත්විණි. එදින 2 ශ්‍රේණියේ සිසුන් විසින් නවක සිසුන්ව මල් කළඹක් දී පිළිගෙන සුබ පැතූ අයුරු.

**ඇන්ටන් ජයසූරිය**

කොම්පඤ්ඤවීදියේ "හෝලි රෝසරි" ළදරු පාසලේ නත්තල් උත්සවය පසුගියදා එම පාසලේදී පැවැත්විණි. ගරු මේරි මැග්ඩලින් පැවිදි සොයුරිය ගේ ප්‍රධානත්වයෙන් පැවැති නත්තල් උත්සවයේ නත්තල් සීයා විසින් දැරියකට තෑගි බෙදා දුන් අයුරු ඡයා රූපයේ දැක්වේ.

**බර්නාඩ් ශ්‍රී කාන්ත**





**මාසික සිතිවිල්ල**

"ජනවාරි මාසය" ළමා ප්‍රදීපය,
අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.



**දිල්ෂාන් සම්පත් ප්‍රනාන්දු**
12 ශ්‍රේණිය
සාන්ත ක්ලැරට්
දෙව්සත්හල - මීගමුව

# වැඩමුළුවක ප්‍රතිඵලයක්
# පොල්ගහවෙල ලූර්දු දේව මාතා දහම් පාසලේ ශූර ළමා ලේඛකයෝ

## පිය සෙනෙහස

අඳුර සරනා නිසල් මේ ලොව
සරණ සොයමින් පිය මනින්නෙමි
කොටසක් කර මා ඔබේ දිවියේ
රකිනුයේ ඔබ තමයි පිය රජුනි
හැරද සැපතක් ඔබේ දිවියෙන්
රකියි නිරතුරු මගේ දිවියම
නිමක් නොදකින ඔබේ සෙනෙහෙට
ණයගැතිය මා සෑමදා
සොයා රන්මසු මගේ සැපතට
වෙහෙස වෙයි ඔබ නිරතුරා
ඔබේ ලෙයින් සැදුනු මගේ ජීවිතේ
ඔබට බාරයි නිරතුරා



**කල්හාර සෙනෙවිරත්න**
**11 ශ්‍රේණිය**
**ලූර්දු දේවමාතා දහම් පාසල - පොල්ගහවෙල**

## ආදර අම්මේ

දයාබර සුදු අම්මේ
නැගෙන විට ඔබේ රුව සිත් මඬලෙහි
ඔබට අප කෙරේ තිබූ
ආදරය මතකයට නැගේ .......

දහසකුත් පැතුම් මල්
මිලින වී ගලන විට
දෙඇසින් වැටෙන කඳුළු කැට
කෙලෙසනම් ඉවසා ඉන්නද?

කියන් සුදු අම්මේ
නුඹ කෙලෙසද කිසිත් නොකියා
සැඟවුණේ වැලිතලයේ
සොහොන් කොතක



**කවිෂ්කා ප්‍රියමන්ති**
**9 ශ්‍රේණිය**
**ලූර්දු දේවමාතා දහම් පාසල - පොල්ගහවෙල**



**කැනියුට් පෙරේරා**
**9 ශ්‍රේණිය**
**ලූර්දු දේවමාතා දහම් පාසල**
**- පොල්ගහවෙල**

## සිසු නායක වැඩමුළුවක්

මීගමුව , මහවීදිය මීසමට අයත් මුන්නක්කරය ශු. නිකුලා හා සිරි කුරුස දේවස්ථානයන්හි දහම් පාසලේ සිසු නායක නායිකාවන් හට වැඩමුළුවක් 2013 ජනවාරි 27 වන ඉරුදින පැවැත්වීමට කටයුතු යොද ඇත. මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක දේශක කුමර නයනජිත් මහතා විසිනි. මහවීදිය මීසම් සහයක මෙම දෙව්මැඳුර භාරව කටයුතු කරන ගරු අරුලානන්දම් උදයදස් පියතුමාගේ අනුශාසකත්වයෙන් මෙය සංවිධානය කෙරේ

**ශිෂ්‍ය නායක සංගමය**

## මගේ ආලෝකය



මගේ ජීවිතය පණ ගන්වමින්
මේ ලෝකයේ ආලෝකය
පෙන්වමින්
මගේ දෑස් විවර කරමින්
ලෝකය දෙස හරවමින්
මා පැසසු ජේසුනේ ......
ඔබට තුති වේ

**මිතුනි කුමාරි ජයලත්**
**9 ශ්‍රේණිය**
**ලූර්දු දේවමාතා දහම් පාසල - පොල්ගහවෙල**



**ජනිත් විජේසූරිය**
**11 ශ්‍රේණිය**
**ලූර්දු දේවමාතා දහම් පාසල - පොල්ගහවෙල**

# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

**පසුගිය කලාපයෙන් හඳුනාගත් පළමු දෙවන පාඩම් තේමාව ඉදිරියට ගෙන යමු.......**

21. ශුද්ධවූ පාවුළුතුමාගේ 1 කොරෙන්ති ලිපිය අනුව මවනු ලැබූ මිනිසා සතු ශරීර වර්ග දෙක කුමක්ද? (2012/01/1)

22. උත්පත්ති පොතේ සඳහන් විස්තරයට අනුව දෙවියන් වහන්සේ සමඟ ගිවිසුමකට ඇතුළුවූ පාර්ශවයන් දෙක නම් කරන්න. ( 2012 /01/11)

23. පාරාවෝ රජුගේ වහලුන් බවට පත්වූ ඊශ්‍රායෙල් ජනතාව කළ කර්මාන්ත දෙකක් නම් කරන්න. (2012 /01/ 11)

24. මැවීම පිළිබඳව කතා පුවත් දෙක අඩංගු සම්ප්‍රදායයන් දෙක නම් කරන්න.

25. පුරාණ ගිවිසුමේදී නව ගිවිසුමක් ගැන කරුණු ගෙනහැර දැක්වූ දිවැසිවරයා කවුද?

⋆ පළමු තේමාව හොඳින් විග්‍රහවන්නට නම් ඒ තේමාව හා බැඳි ප්‍රශ්න ගැඹුරින් විමසා බැලිය යුතුය. දෙවන ප්‍රශ්න පත්‍රයේ ලකුණු 10 ක හෝ 20 ක ප්‍රශ්නයක් පළමු තේමාව යටතේ ලැබේ එබැවින් ඒ ප්‍රශ්න දෙස හොඳින් විමසා බලමු. (රචනාමය ප්‍රශ්න රටා)

26. දෙවිඳුන්ගේ මහිමයෙන් සිදුකළ නව සොයා ගැනීම මුල් කොට ගෙන ප්‍රසිද්ධ වූ විද්‍යාඥයින් දෙදෙනකු නම් කරන්න. (2012 /02/01)

27. නව ගිවිසුමේ සඳහන් භාග්‍යයන් (මංගල වාක්‍යය) තුනක් ලියන්න. (2012/02/11)

28. භාග්‍යයන් අට කිතුනු පැවැත්මේ බලය ලෙස සලකා ඒවා ඔබේ ජීවිතයට සම්බන්ධ කරගන්නා අයුරු කරුණු පහකින් පෙන්වා දෙන්න. (2012/02/11)

29. වර්තමාන මනුෂ්‍යයාගේ ප්‍රබලතා දෙකක් ලියන්න (2012/03/1)

30. නූතන ලෝකය තුළ මිනිසාගේ දුබලතා තුනක් සඳහන් කරන්න. (2012/03/11)

31. ''විද්‍යාව හා තාක්ෂණය මගින් දේව මහිමය වඩ වඩාත් අනාවරණය කරගත හැකි '' යන අදහස සනාථ කිරීමට කරුණු පහක් ඉදිරිපත් කරන්න. (2012/03/111)

32. මිනිසාගේ ආරම්භය සහ පැවැත්ම ගැන ඉදිරිපත් කර ඇති විවිධ න්‍යායයන් දෙකක් නම් කරන්න.

**ගුරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.**




**පමුණුගම , බෝපිටිය, ශු. නිකුලා දහම් පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය ගුරු ක්ලෝඩ් වනසිංහ පියතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා දේවස්ථාන භූමියේදී පැවැත්විණි.**

**මීසම් සේවක ගුරු එරින්ටන් සිල්වා පියතුමාගේ මඟ පෙන්වීම මත දහම් ගුරු මණ්ඩලය මෙය සංවිධානය කෙරිනි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි වෙති.**



**සේයා , සටහන - ඇන්ටන් ජයසූරිය**



## අනුරාධපුර පදවිය

හබරණ ආරෝග්‍ය දේව මාතා දේවස්ථානයේ දරු දැරියෝ නවදෙනෙක් පසුගියදා මීසම් සේවක ගරු ඩේමියන් පෙරේරා පියතුමන් අතින් ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ.

ගරු ක්‍රිස්ටි ප්‍රනාන්දු පැවිදි සොයුරිය (ශු.ප.නි) ළමුන් පුහුණු කළ අතර දිව බොදුන් ලැබීමෙන් අනතුරුව ළමුන් මීසම් සේවක පියතුමා හා පැවිදි සොයුරියන් සමඟ ළමා ප්‍රදීපය සඳහා සේයාරුවකට පෙනී සිටි අයුරු.




**චමත් ඉමාෂ කුරේ - හබරණ**

## රත්නපුර පදවිය

පසුගියදා රත්නපුර මීසමේ ළමෝ 51 දෙනකු රත්නපුර රදගුරු අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා හිමිපාණන් අතින් රත්නපුර ජේසු බිළිඳුගේ කන්‍යාරාම දෙව් මැදුරේදී ප්‍රථම වතාවට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. දේව මෙහෙයෙන් පසු රදගුරු හිමිපාණන් මීසම් සේවක ගරු රන්ජන් මාල් මොරායස් , මීසම් සහයක ගරු නිකලස් ගේබ්‍රියෙල් පියතුමන්ලා හා ගරු පැවිදි සොයුරිය , ගුරු මහත්මීන් සමග ළමුන් සේයාරුවකට එක්වූ අයුරු

**තියබෝල්ඩ් සමරතුංග**



# හලාවත පදවියේ දහම් පාසලක දරුවන්ගෙන් උතුම් ක්‍රියාවක්.

## ළමෝ මුදල් එකතු කොට පියතුමන්ලාට, දෙමාපියන්ට හා ගුරුතුමියට තෑගි දෙති

මාරවිල මීසමට අයත් වීරහේන සාන්ත අන්තෝනි දහම් පාසලේ 2012 වාර්ෂික ත්‍යාග බෙදාදීමට සමගාමීව පැවැත්වූ නත්තල් උත්සවයේදී රටටම ආදර්ශයක් වූ ඉතා වටිනා ක්‍රියාවක් මම දුටුවෙමි. දහම් පාසලේ 7 ශ්‍රේණියේ ගුරුතුමියගේ ඉල්ලීමකට අනුව දරුවන් කැටවලට මුදල් එකතුකර ඇත. කැටවල එකතුවූ මුදලින් තම දහම් පාසල් ගුරුතුමියට , තම දෙමව්පියන්ට පමණක් නොව උත්සවයේ ප්‍රධාන ආරාධිතයින් වූ මාරවිල මීසම් සේවක ගරු අයිවන් පීටර්, මීසම් සහයක ගරු දිලංක නිර්මාන් යන පියතුමන්ලාටද ත්‍යාග පිලිගැන්වූහ.

පන්තියේ එක් එක් දරුවන්ගේ නම කියවන විට ඉදිරියට පැමිණ තම අම්මට, තාත්තාට, වැඳ තමන් එකතු කළ මුදලින් ගත් ත්‍යාග පිරිනමන විට දරුවන් ඉතා සතුටකින් හා අභිංසක නිහතමානි ආඩම්බර හැඟීමකින් සිටි බව මට පෙනුනි. දරුවන් පාසල් යන විට මග තොටකදී වන අවශ්‍යතාවයකට හෝ අමතර ආහාරයක් ලබාගැනීමට එදිනෙදා අතට දෙන කුඩා මුදලින් එම දරුවන් කළ මෙම සත් ක්‍රියාව දුටු දෙමව්පියෝ සතුටු කඳුළු වැගුරූහ. මෙම අවස්ථාව පැමිණ සිටි සැමට ඉතා හැඟීම්බර මොහොතක් විය. ළමුන් විවිධ දේ සඳහා මුදල් නාස්ති කරන මෙවන් වකවානුවක මෙම ක්‍රියාව මිල කළ නොහැකි වටිනාකමකි, ආදර්ශයකි.

**යූ.එල්. කලණි පෙරේරා**
දහම් පාසල් නියෝජිත
සා. අන්තෝනි දහම් පාසල - වීරහේන

**පසුගිය සතිය හා සබැඳේ...**

## තලවිල

ශු. ආනා මුනිශ්වරියට කැප කර ඇති ලක්දිව ප්‍රධානතම දෙවන සිද්ධස්ථානය වූ තලවිල, කැලෑ පල්ලිය ප්‍රමුඛ කල්පිටිය අර්ධද්වීපයේ ම අප අපෝස්තුළුවරයාණන් සැරිසැරූ අතර තලවිල පවතින ශ්‍රී කුරුසිය එතුමාණන්ගේ යුගයට අයත්ය.


තලවිල

## බෝලවත්ත


බෝලවත්ත

භාග්‍යවත් ජුසේවාස් මුනිඳුන්ගේ පාද ස්පර්ශය ලද තවත් සතරකෝරළයේ ප්‍රධාන ස්ථානයක් වන බෝලවත්ත බෙහෙවින්ම ජනප්‍රිය වූයේ අති පූජ්‍ය ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා වෙත, නරේන්ද්‍ර සිංහ රජතුමා විසින් නින්දගමක් ලෙස පවරා දුන් ප්‍රදේශයක් නිසාවෙනි. ක්‍රි.ව. 1742 ජුලි 17 වනදා ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා ස්වර්ගස්ථ වූ කල එතුමාණන් මිහිදන් කළේද මේ දේවස්ථානයේය.

## මහගල්ගමුව



ගල්ගමුව

කුරුණෑගල පදවියේ ප්‍රධානම වන්දනා ස්ථානයක් වන මහගල් ගමුව ක්‍රි.ව. 1691 දි භාග්‍යවත් ජුසේ වාස් මුනිඳුන් මෙහි කතෝලිකයන් සොයා ගොස් එකල ඔවුනට පැවති වල්අලින්ගේ ද, සර්පයන්ගේ හා කිඹුලන්ගේද උවදුරු හමුවේ කළුවර ශ්‍රී කුරුසියක් ස්ථාපිත කළ අතර ලක්දිවට පැමිණෙන කිසිදු ධර්මදූතවරයකුට සර්පයන් හා වන සතුන්ගෙන් කිසිදු උපද්‍රවයක් නොවන ලෙසට ප්‍රබල ආශිර්වාදයක් එතුමාණන් දානය කළ අතර , එදා සිට අද දක්වා වනසතුන්ගේ හා සර්පයන්ගේ උවදුරු හමුවේ ලක්වූ කිසිදු ධර්මදූත වරයකු පිළිබඳව වාර්තා නොමැත.

## වෑ උඩ

ක්‍රි.ව. 1692 දී කන්ද උඩරටට යන අතරේදී ජුසේවාස් පියතුමාව කන්ද උඩරට රජු විසින් පෘතුගීසි ඔත්තුකරුවකු ලෙස අත්අඩංගුවට ගත්තේ, වෑ උඩ ග්‍රාමයේදීය.

# ලංකා අ


අගරදගුරු මැදුර



මෙම ග්‍රාමය ඕලන්ද යුගයේ ප්‍රධානතම ධර්මදූත මධ්‍යස්ථානයක් විය.

## වහකොට්ටේ

ඉපැරණි කතෝලික ගම්මානයක් වන වහකෝට්ටේ ග්‍රාමය තුළ ඓතිහාසික ශු. අන්තෝනි මුනිඳුන්ගේ ප්‍රතිමාව මුල්කරගෙන කල්යත්ම සිද්ධස්ථානයක් බවට පරිවර්තනය විය. මේ සිද්ධස්ථාන භාග්‍යවත් ජුසේ වාස් පාද පහස ලද සුවිශේෂි ස්ථානයක් වන අතර මෙහි පළමු දේවස්ථානය මෙතුමා විසින් ක්‍රි.ව. 1699 දී ඉදිකරන ලද බව සඳහන් වේ. තවද එතුමාණන්ගේ යුගයට අයත් ඓතිහාසික ශ්‍රී කුරුසියක් හා දේවමාතා ප්‍රතිමාවක් ද දක්නට ලැබේ.


වහකෝට්ටේ

## මානියංගම

අවිස්සාවේල්ල මානියංගම ලෙස ප්‍රකට අදත් ලෙන් විහාරස්ථානය පිහිටා තිබූ ස්ථානය , ඕලන්ද යුගයේ දේවමාතාවන්ට කැප වූ දේවස්ථානයක් විය මෑණියන්ගේ ගම පසුව "මානියංගම " ලෙස ව්‍යවහාර වූ අතර මෙම ලෙන් විහාරයේ ජුසේවාස් පියතුමා පරිහරණය කළ ඇඳක් තවමත් දක්නට ලැබේ

# පෝස්තුළුවරයාණෝ



වෑඩ

## කළමුල්ල

ක්‍රි.ව. 1699 දී කළුතර කළමුල්ලේ ධර්මදූතික මෙහෙවරේ යෙදුණු ජුසේවාස් පියතුමා සති 3 ක කාලයක් කළමුල්ලේ වලෙන්තිනු රාළගේ නිවසේ නතරවී සිටි අතර, එම නිවස අද පවා දක්නට ලැබෙන අතර එහි වලෙන්තිනු රාළ වෙත, ත්‍යාග කළ ඇත් දළින් නෙලූ ශු. අන්තෝනි මුනිඳුන්ගේ හා ජපමාල මාතා ප්‍රතිමාවන් අදත් හලාවත රදගුරු හිමිපාණන් සතුව පවතී.



කළමුල්ල

## මෝදර

කොළඹ නගරයේ පවතින ඉපැරණි දේවස්ථානය මෝදර ශු. ස්නාවක ජුවාම් මුනිඳුන්ට කැපවූ දේවස්ථානය වන අතර එයට වසර 500 ක ඉතිහාසයක් ඇත. තවද මෙම ස්ථානය භාග්‍යවත් ජුසේවාස් පියතුමාගේ පාද ස්පර්ශය ලද කොළඹ නගරයේ ප්‍රධානම ස්ථානයකි.



වැල්ල පල්ලිය



මෝදර

## වැල්ල පල්ලිය (වත්තල)

වැල්ල පල්ලිය කාර්මෙල් දේවමාතා දෙව්මැදුරද , ලංකා අපෝස්තුළු වරයාණන්ගේ පාද ස්පර්ශය ලද ප්‍රදේශයකි. මේ දේවස්ථානයේ එතුමන්ගේ යුගයට අයත් ඓතිහාසික ශ්‍රී සළුධාතු දේවමාතා ප්‍රතිමාවක් (ඇත් දළින් නෙලූ ) දක්නට ඇත.

## අගරදගුරු මැඳුර

කොළඹ අගරදගුරු මැඳුරේ ලංකා අපෝස්තුළුවර භාග්‍යවත් ජුසේවාස් මුනිඳුන්ගේ ඉපැරණිම සිතුවම හා එතුමන්ගෙ ජීවිත කාලයේ දී එතුමන් පරිහරණය කරන ලද සළුවක් ඉතා සුරක්ෂිතව පවතී.

අසේල දසනායක



මානියංගම



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

**පාඩම් අංක : 83**

## BY සහ With

අපි තවත් Prepositions (නිපාත) දෙකක් වන By සහ With වාක්‍ය වල යෙදෙන හැටි අධ්‍යයනය කරමු.

මේ by සහ with යන පද දෙක බොහෝ අය වරදවා වාක්‍යවල යොදනවා. අපි ඒ වැරදි යෙදීම් සමඟ නිවැරදි යෙදුම් සසඳා බලා නිවැරදිව යෙදීමට ඉගෙන ගනිමු.

With කියන එකේ සාමාන්‍ය තේරුම "සමඟ" කියන එකයි.

**නමුත් යම්කිසි දෙයක් කිරීමට උපයෝගී කරගන්නා, උදව්කර ගන්නා දෙයක් පිළිබඳව ප්‍රකාශ කිරීමට අපි සමහර අවස්ථාවලදී with යොදනවා.**

ඒ වගේම by කියන එකෙන් අදහස් කීපයක්ම කියැවෙනවා. **නමුත් by කියන වචනය, යමක් කරනු ලබන්නේ කව්රුන් විසින්ද කියන අදහස ප්‍රකාශ කිරීමට භාවිතා කරනවා.**

ඒ ගැනයි අපි අද කතා කරන්නෙ. සමහර වැකි වලින් කියැවෙන අදහස අනුව යෙදිය යුත්තේ by ද නැත්නම් with ද යන්න සමහරුන්ට ගැටලුවක් වෙන අවස්ථාත් තියෙනවා.

ඒ නිසා මේ ඉහත අදහස සිතේ රඳවාගන්න. එතකොට යෙදිය යුතු නිවැරදි වචනය සොයා ගැනීම ලේසියි.

නැවත ඒ අදහස කෙටියෙන් කියන්නම්.

**සාමාන්‍යයෙන් with යෙදෙන්නෙ යමක් කිරීමට උදව් වූ, උපයෝගී කරගත් දෙයක් හෝ කෙනෙක් ගැන කීමටයි.**

**by යෙදෙන්නේ යමක් කළ පුද්ගලයාව හඳුන්වා දීමටයි.**
**අපි නිදසුන් කීපයක් බලමු.**

1. This board was cut **by** a carpenter **with** a saw.
(දිස් බෝඩ් වෝස් කට් බයි අ කාපෙන්ටර් විත් අ සෝ)
මේ බෝඩ් එක කපල තියෙන්නෙ වඩුවෙක් විසින් කියතකින්.

මෙහිදී "කියතක ආධාරයෙන්" යන අදහස සඳහා '**with** a saw' කියල කියනවා. "වඩුවෙක් විසින්" කියන අදහස කීමට '**by** a carpenter' යන්න යෙදිල තියෙනවා.

2. The prisoner was bound **with** chains **by** the jailer.
(ද ප්‍රිස්න(ර්) වෝස් බවුන්ඩ් විත් චේන්ස් බයි ද ජේලර්)
සිරකරුවාව බන්ධනාගාර නිලධාරියා විසින් දම්වැල් වලින් බඳිනු ලැබුවා.

**with** chains - දම්වැල් වලින්, දම්වැල් උපයෝගී කොටගෙන
**by** the jailor - බන්ධනාගාර නිලධාරියා විසින්.

3. The gate was locked **by** the security guard **with** a key. (ද ගේට් වෝස් ලොක්ඩ් බයි ද සෙකියුරිටි ගාර්ඩ් විත් අ කී) ගේට්ටුව ආරක්ෂක නිලධාරියා විසින් යතුරකින් (ලොක් කරනු ලැබුවා) වසනු ලැබුවා.

**with** a key - යතුරකින්, යතුරක් උපයෝගී කොට ගෙන
**by** the security guard - ආරක්ෂක නිලධාරියා විසින්.

4. The picture was drawn **by** the child **with** a pencil.
(දි පික්ච(ර්) වෝස් ඩ්‍රෝන් බයි ද චයිල්ඩ් විත් අ පෙන්සිල්)
පින්තූරය ළමයා විසින් පැන්සලකින් අඳිනු ලැබුවා.

**by** the child - ළමයා විසින්
**with** a pencil - පැන්සලකින් (පැන්සලක් උපයෝගී කොටගෙන)

# ක්‍රිස්තියානි ගෘහ නිර්මාණ ශිල්පයේ ආරම්භය හා විකාශනය

## නෝර්මන් ශෛලීය

බොහෝ විට නෝර්වේ රටේ සහ එංගලන්තයේ මෙම කලාව දක්නට ලැබේ. එය එතරම්ම ව්‍යාප්තවී ගිය ශෛලියක් නොවේ . වර්ෂ 1666දී නෝර්මන් ගෝත්‍රිකයෝ එංගලන්තය අල්ලා ගැනිම නිසා මෙම කලාවට අයත් දේවස්ථාන අද බොහෝ දුරට දක්නට ඇත්තේ එංගලන්තයේය. එමෙන්ම මෙම කලාව ආරම්භ වී ඇත්තේ උතුරු යුරෝප යේය. නෝර්මන් ගෘහ නිර්මාණ ශිල්පයේ විශේෂ ලක්‍ෂණයක් නම් විශාල කුළුණු තිබීමයි. එමෙන්ම ගොඩ නැගිල්ල ඉතාමත් ගාම්භීර බවක් පෙන්වයි. එහි කුළුණු රවුම්ව හෝ හතරැස් ආකාරයට නිමවා ඇත. මෙම කලාවට අයත් සැම දෙව් මැදුරකම විශාල එක් කුළුනක් තිබීම එහි විශේෂිතම ලක්‍ෂණයයි.

එමෙන්ම දේවස්ථානයේ ඇතුලත සිලීමේ විවිධ වර්ණයන් යෙදූ මෝස්තර දක්නට ලැබේ. මධ්‍යම කොටසට යාබද පැති හතරකින් සමන්විත වන මෙම දේවස්ථානය ඉතාමත් විශාලය. නෝර්මන් ශෛලියට අයත් ගොඩනැගිලි වල ලක්‍ෂණ රඳා පවත්නේ එහි විශාලත්වය හා ගාම්භීරත්වය උඩය. මෙම දේවස්ථාන ගොඩ නගා ඇත්තේ ගලින්ය. දැව භාවිත කර ඇත්තේ ඉතාම මද වශයෙන්ය. ගලින් නිමවා ඇති නිසා එහි ගාම්භිරත්වය වඩාත් දිස්වේ.

ගොතික් කලාව හඳුන්වා දීමට වඩාත්ම සුදුසු නිදසුන වන්නේ පැරිසියේ නෝත්‍රදාන් දේවස්ථානයය. මෙහි විශේෂ ලක්ෂණය වන්නේ ගොතික් කලාවට අයත් ප්‍රධාන ලක්ෂණයක් වන උස්වූ කණු දෙකයි. එමෙන්ම එම කණු නොහොත් අට්ටාල සම්බන්ධව ඇත්තාවූ මුක්කු සතර සහ ඒවා නිසා බෙදී ගිය බිත්තිද උල්වූ ආරුක්කු ආදි දෑද එම දෙව් මැදුරේ විශේෂ ලක්ෂණයක් වෙයි.



## ගෝතික් ශෛලිය.

ගොතික් ක්‍රමය බිහිවුයේ උතුරු ජර්මනියේ ''ගොත්'' ගෝත්‍රිකයන් අතරය. 10 වෙනි සියවස් වලදී ආරම්භවූ මෙම අලුත් ගෘහ නිර්මාණ ශෛලියක් වන ගොතික් ශෛලියට යොදා ගෙන ඇති එම ගොතික් යන වචන යෙන් අදහස් කරන්නේ ''නීරස'' යන්නයි. මෙම ශෛලීය ඉතාලියේ හැර යුරෝපයේ සෑම තැනකම පාහේ පැතිර ගියේය.

ඉතාලියේ රෝමානු කතෝලික සභාව මෙම ශෛලියට එතරම් කැමති වුයේ නැත. පසු කලකදී පුනරුදයේ බලපෑමට හසුවූ විචාරකයෝ මෙම කලා ක්‍රමය හෙලා දැකීම සඳහා එය ගොතික් යනුවෙන් නම් කළේය. එහි අදහස ඉහතින් දැක්වූ ලෙස ම්ලේච්ඡ හේ නීරස යන්නයි. එනම් අද දක්වා එය හඳුන්වන්නේ මුලින් යොදන ලද එම ගොතික් යන පදයෙන්ය.

ක්‍රි.ව. 1150 සිට 1250 දක්වා ගෘහ නිර්මාණ ශිල්පය කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්වූ බැතිමතුන් ගොතික් ගෘහ නිර්මාණ ශෛලිය කෙරෙහි වැඩි අවධානයක් දැක්වූහ. ඒ අනුව 1220 සිට 1420 අතර කාලය ගොතික් කලාවේ ක්ෂේත්‍ර යුගය වශයෙන් සැලකිය හැකිය. මෙම යුගය යුරෝපයේ පුනරුදයට මුල පුරන යුගයක් විය. සමාජමය හා ආර්ථිකමය වශයෙන් මිනිසාගේ සිතුම් පැතුම් රටාවේ වෙනසක් දක්නට තිබූ නිසා එම චින්තනය ගොතික් කලාවට බල පෑවේය.

ගොතික් කලාව හඳුන්වා දීමට වඩාත්ම සුදුසු නිදසුන වන්නේ පැරිසියේ නෝත්‍රදාන් දේවස්ථානයය. මෙහි විශේෂ ලක්‍ෂණය වන්නේ ගොතික් කලාවට අයත් ප්‍රධාන ලක්‍ෂණයක් වන උස්වූ කණු දෙකයි. එමෙන්ම එම කණු නොහොත් අට්ටාල සම්බන්ධව ඇත්තාවූ මුක්කු සතර සහ ඒවා නිසා බෙදී ගිය බිත්තිද උල්වූ ආරුක්කු ආදි දැද එම දෙව් මැදුරේ විශේෂ ලක්ෂණ යක් වෙයි.

මෙම උල්වූ ආරුක්කු නිසා වහලයේ බර එල්ල වන්නේ බිත්ති වලට නොවේ එනම් එම ආරුක්කු කීලයක් එකට එක්වූ කුළුණු මතටය. මේ හේතුවෙන් බිත්තිවල කවුළු තැබිය හැකි විය. එම කවුළු විවිධ වර්ණ ඇතුලත් වීදුරු මගින් අලංකාර කරන ලදී. ගොතික් ගොඩ නැගිල්ලක විශේෂ ලක්‍ෂණය වන්නේ කුළුනෙන්ම විහිදී ගොස් වහලය සැදී තිබීමයි.

එනම් ගලින් සැදූ කුළුනේ කොටස් වහලයට රැකුල් දීමට දිගටම විහිදී යයි. ඒවා රිබ්ඩ් වෝල්ස් යනුවෙන් නම් කරයි. ගොතික් ක්‍රමයේ එන ආරුක්කු නෝර්මන් ක්‍රමයේ මෙන් රවුම් ආරුක්කු නොවේ උඩ මුදුනක උල්වූ ආරුක්කු ගොතික් කලාවට අයත්වේ. ගොතික් කලාවේ ප්‍රායෝගික උවමනාවන් කලාවට හරවාගෙන ඇත. එනම් වහලය සාදවා ගැනීමට ආරුක්කු අවශ්‍යය එය කලාවටම අනුකූලව සාදා ඇත. මෙවැනි ලක්‍ෂණ සංකලනයවූ ගොතික් ගෘහ නිර්මාණ ශිල්පයට ඇත.

**සංස්කාරක පියතුමන් විසිනි**




පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ලමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

**මුහුදු වෙරළ**
**නයන්තාරා පෙරේරා**
5 ශ්‍රේණිය
සාන්ත බ්‍රිජට් කන්‍යාරාමය
කොළඹ 07



**දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ**
**සඳුන් චාමර**
**6 ශ්‍රේණිය**
සාන්ත මරියා දහම් පාසල
හාල්දඩුවන



**ජේසුස් වහන්සේ බෞතිස්ම ස්නාපනය කිරීම**
**ඉසුරි සෙව්මිණි.**
6 ශ්‍රේණිය
ශු. මිඛායෙල් අග්‍රදූත දහම් පාසල
නාගොඩ , කළුතර





**දිය ඇල්ලක්**
**රෝෂිමා සත්සරා කුරේ**
8 ශ්‍රේණිය
සුරදූතිකා අපේක්ෂාවේ පාසල පයාගල



**දෙවිඳුන් මැවූ ලෝකය**
**ශානිකා මධුවන්ති**
3 ශ්‍රේණිය
සිදුකුමාරි දහම් පාසල
වයික්කාල



**පලතුරු කන කුරුල්ලෝ**
**ෂෙහාරා රෝෂාලි**
7 ශ්‍රේණිය
දන්කොටුව බාලිකා මහ විදුහල
දන්කොටුව



# ශුද්ධවූ ප්‍රැන්සිස් සාලෙස් මුනිතුමා

## සුදුවර චරිතයක් හඳුනාගනිමු

**ඒ ක්‍රිස්තු වර්ෂ 1567 අගෝස්තු මස 21 වැනි දය. ප්‍රංශයේ සැවෝයිහි සාලෙස් නගරයේ සාලෙස් මාළිගයට නව සාමාජිකයෙක් එක්වූ දිනයයි.**

එනම් ශුද්ධවූ ප්‍රැන්සිස් සාලෙස් මුනිඳුන්ගේ උපත සිදුවූ දිනයයි. එතුමා ජන්ම ලාභය ලැබූ සාලෙස් මාළිගය කිරිගරුඬ , අලංකාර භාණ්ඩ , මනස්කාන්ත මල් බඳුන් , රන් හුයෙන් නිර්මිත අගනා පලස්, කොඩි සේසත් , චිත්‍ර මූර්ති කැටයම් යනාදියෙන් ආඪ්‍ය විය.

මෙහි කාමර 25 ක් තිබිණි. මෙතුමා ගේ මෑණියන් අල්පේච්ඡ ජීවිත රටාවකට හුරුවූ කාන්තාවකි. භෞතික වස්තූන් කෙතරම් පැවතියද ඇය එයට වඩා ආධ්‍යාත්මික ගුණ වගාව තුළින් පරිපූර්ණ වූවාය. ඇය ප්‍රැන්සිස් මුනිතුමා කුඩා අවධියේ පටන් කිතු සමිඳුන්ට හා මරිය මාතාවන්ට යොමු කරන්නට සමත්වූවාය. ළමා වයසේදී වුවද ඔහු කෙළි සෙල්ලම් වලට එතරම් කැමැත්තක් දැක්වූයේ නැත. ඔහු වඩාත් සන්තෝෂයකින් දේවස්ථානයට සම්බන්ධවිය.

මෙතුමා ගුණ නැණ බලෙන් ප්‍රබල තාවක් දක්නට ලැබිණ. මොහු සිය උසස් අධ්‍යාපනය සඳහා තෝරා ගත්තේ ජේසු නිකායේ පියවරුන් පාලනයට සම්බන්ධවූ ක්ලේමොන්ට් සරසවියයි. එහිදී අර්ථ ශාස්ත්‍රය (ECONOMICS ) දේව ධර්ම ශාස්ත්‍රය (Theology) , මනෝ විද්‍යාව ( Psychology ) , නීතිය ( Law ) හා විවිධ භාෂා යන සැම විෂයකින්ම එතුමාට ප්‍රථම ස්ථානය දිනා ගැනීමට හැකිවිය. එසේ වුවද මෙතුමා දෙවිඳුන්ට අවනත බව සියලු අවස්ථාවලදී නිරූපණය කළේ ය. මොහු සතිපතා පාපොච්චාරණය කළේය. දින පතා ජපමාලය බැතියෙන් උච්චාරණය කළේය.

වර්ෂ 1588 දී පාදුවාහි සුවිශාලතම විශ්ව විද්‍යාලයට ඇතුලත්වූ ශුද්ධවූ ප්‍රැන්සිස් තුමා එහිදී දේව ධර්ම ශාස්ත්‍රය හා රෝම නීතිය සම්බන්ධව විශාරදයකු බවට පත්විය. වර්ෂ 1591 දී ප්‍රැන්සිස් තුමා සරසවිය නිලවරණයේදී ආචාර්ය උපාධියෙන් පිදුම් ලැබීය. වර්ෂ 1592 දී නොවැම්බර් මාසයේ 24 වැනිදින ප්‍රංශයේ සෙනෙට් සභාවේ ඒකමතික නිගමනයක් අනුව මොහු නීතිඥයකු බවට ප්‍රකාශයට පත් කෙරිණි.



1593 දෙසැම්බර් 8 වැනිද ප්‍රැන්සිස් තුමා පූජකවරය ලැබීය. සාලෙස් පුරවරයේ ව්‍යක්ත කථිකයෙක්, දේශනාවාදියෙක් ලෙස ඉතා කෙටි කලකින් ජනප්‍රියත්වයට පත්විය. දුකටපත් වූවන් සැනසීම, දුගීන් රෝගීන් බැහැදැකීම මෙතුමාගේ දින චර්යාවට ඇතුලත් විය. 1602 වසරේදී ප්‍රැන්සිස් තුමා ජිනීවාහි රදගුරු ලෙස අභිෂේක ලැබීය.

එහිලා විශේෂ දෙයක් සිදුවිය. එනම් පිටස්තරයෙන් කළ තේවාවන්, අභ්‍යන්තරයේ ශුධවූ ත්‍රිත්වයේ තුන්දෙනා වහන්සේලා විසින් කළ බව දර්ශනය කිරීමට මෙතුමා සමත්විය. කැල්වීනියානු වේදභේද කරුවන් 72000 ක් සිය දේශනා මගින් කිතු දහමට එක් කර ගැනීමට එතුමාට හැකිවිය. එවන් වගකීම් අධික ක්‍රියාවන් සඳහා ඔහු ශුද්ධවූ බයිබලයත් , සිය යැදුම් පොතත් රැගෙන ගමන් ඇරැඹුවේ ඉතා අහීත අන්දමකිනි.

ලේඛකයින්ගේ හා පුවත්පත් කලාවේදීන්ගේ ආරක්ෂක සාන්තුවරයා ලෙස 1923 දී ප්‍රකාශයට පත් කෙරිණ. එතුමා අතින් කතෝලික සභා මාතාව නගා සිටුවීම සඳහා දෙදහසකටත් අධික පොත්පත්, ලිපිලේඛන ලිවීම එයට හේතුවයි. '' Love Of God '' , ''Little virtues '' ''Devout life '' යන කතෝලික ග්‍රන්ථ ශුද්ධවූ සභා සාහිත්‍යයට එක්වූ සම්භාව්‍ය කෘතීන්ය. මෙතුමා ශුද්ධවූ සභාවේ ගෞරවයට 1665 එසැවූ අතර මෙතුමා අප ශුද්ධවූ කතෝලික සභා මාතාවගේ ඉතා ශ්‍රේෂ්ඨ පුත්‍රැවනක් ලෙස සඳහන් කිරීමට පුළුවන. එතුමාගේ ගමන් මග අනුග මනය කිරීම එතුමාට කරන භක්ත්‍යාදරයක් වන්නේ. ජනවාරි 24 වැනිදින එතුමාට කැප කර ඇත.

මලින්ත බෝපෙආරච්චි

# ප්‍රහේළිකා අංක 35



සැකසුම

තිළිණි දුතිකා පෙරේරා

**හරහට**

1. මංගලම් කීමට පැමිණි ගාබ්‍රියෙල් දේවදූතයාට මරිය තුමිය පැවසුවේ "බලන්න මම ස්වාමින් වහන්සේගේ ..... වෙමි. ඔබ පැවසූ ලෙස මට සිදු වේවා'යි යනුවෙනි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

3. .......... වරදවා ගැනීම , පය ලිස්සා වැටීමට වඩා අයහපත්ය" යනුවෙන් උපදේශකයා හෙවත් සිරාක් පවසයි.

4. මරියතුමියගේ උදාන ගීතයේ මෙසේ සඳහන් වේ. සමිඳාණෝ මහා නරපතීන් සිය සිහසුන්වලින් ....හෙලා දීනයන් ඉහල නංවා උසස් කළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ක්‍රිස්තුන් වහන්සේ සුවකළ ලාදුරු රෝගීන් දස දෙනාගෙන් උන්වහන්සේට ස්තුති කිරීමට නොපැමිණි සංඛ්‍යාව

7. මෙහි ඉඩකඩ නොමැති වූයෙන් ජේසු බිළිඳුගේ උපත සිදු වුයේ ගවලෙනකය.

**පහළට**

1. මරිය තුමීය දේව මාතාවන් ලෙස තෝරා ගන්නා විට එතුමිය .....රජ පරපුරෙන් පැවත එන ජුසේතුමා හට විවාහ ගිවිසුම් දී සිටියාය. මෙහි හිස්තැනට සුදුසු වචනය

2. මරිය තුමියගේ උදාන ගීයේ මෙසේ සඳහන් වේ සමිඳාණන් සාගිනි වුවන්.... දෙයින් සතප්වා ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ස්නාවක ජුවාම් තුමාගේ එක් දේශනයකදී මෙසේ ප්‍රකාශ කළේය. ....... හොඳ හැටි පිරිසිදු කරන පිණිසත් ධාන්‍ය පෙළා සිය අටුවෙහි රැස්කරන පිණිසත් ක්‍රිස්තුන් වහන්සේ අතේ කුල්ල ඇත. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ස්නාවක ජුවාම් තුමා උපදින විට සකරියස්තුමා ගොළු ව සිටිය බැවින් තම පුත්‍රයාට දිය යුතු ......... ගල්ලෑල්ලක ලියා පෙන්වූ බව ශු. බයිබලයේ සඳහන් වේ. මෙහි හිස්තැනට සුදුසු වචනය

6. අප ලෝකයේ ආලෝකය විය යුතු බවත් මිනිස්සු පහනක් දල්වා බඳුනක් ..... නොව පහන් රුකක් මත තබා සියල්ලන්ට එළිය ලබා දෙන බව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක.

**(මෙම ප්‍රහේළිකාව පිරවීමේදි පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. ලුක් 1,2,3,4, 17, 19, උපදේශකයා හෙවත් සිරාක් 20, ශු. මතෙව් 5 )**




පල්ලන්සේන "කුවින් ඔෆ් එන්ජල්ස්" පෙර පාසලේ වාර්ෂික නත්තල් උත්සවය කොම්පඤ්ඤවීදියේ මීසම් සේවක ගරු හයිසින්ත් පෙරේරා පියතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගියද පැවැත්විණි.

මෙම අවස්ථාවට පල්ලන්සේන මීසම් සේවක පියතුමන් ඇතුලු ගරු පියතුමන්ලා හා පැවිදි සොයුරියන්ද සහභාගි වූ අතර මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දැක්වේ. **මෙල්වින් ද කොස්තා.**




## කැරොල් ගී ප්‍රසංගයක්

කන්දතොඩුවාව රජයේ විදුහලේ විදුහල්පතිතුමාගේ සංකල්පයකට අනුව පළමුවරට කිතුනු නොකිතුනු ගුරු භවතුන්ගේ දයකත්වයෙන් පාසලේ සිසු දුවා දරුවන්ගේ සහභාගිත්වයෙන් මීසමට අයත්, දොස්තර වත්ත, කජු වත්ත, මුක්කුතොඩුවාව, කන්දතොඩුවාව, පල්ලිවාසල් වාඩු, ප්‍රදේශ ආවරණය කරමින් එළිමහන් නත්තල් කැරොල් ගී ප්‍රසංගයක් හා වීදි නාට්‍යයක් පැවැත්විණි.

**ෂෙලී රතුගම**

## ප්‍රහේළිකාව පුරවා එවීමේදී

- ප්‍රහේළිකා පුරවා එවීමේදි ඔබගේ නම, ලිපිනය, පාසල, දහම් පාසල, ඉගෙනුම ලබන ශ්‍රේණිය හා දුරකතන අංකයද පැහැදිලිව ලියා අප වෙත යොමු කරන්න.
- එක් අයෙකුට ප්‍රහේළිකා පුරවා එවිය හැක්කේ 2 ක් පමණක් බැව් කරුණාවෙන් සලකන්න.
- ඔබ පුරවා එවන ප්‍රහේළිකාව තැපැල් පතක අලවා එවීමද **අනිවාර්ය** බැව් සලකන්න.

**සංස්කාරක පියතුමා**


කුමාරිට පයින් ඇවිදල යන්න වරම ලැබුනාම කුමාරයට හරිම සතුටුයි.. කුමාරයා, කුමාරි ළඟට ...ළංවුනා..
කුමාරි
කුමාරුණු
රජ කුමාරයයි
කුමාරියයි
30
කථාව :- ආනන්ද කාල්ලදර්ා.. දෙමස්, චිත්‍ර :- ඇස්.ඒ.පී. සපුආරච්චි..
මන්ත්‍ර කාරිය.. අපි මාළුන් ඔබට පත්කරනු කුමාරයගෙ යාළු කුමාරවරුන් ඔක්කොම නැවතත් යථා තත්වයට පත්කරන්න...
එවිට මන්ත්‍රකාරිය තවත් මන්ත්‍රයක් ජපකර මන්ත්‍ර යෂ්ටිය මාළුන් දෙසට දික්කළා..
ආ.. හරිම පුදුමයි.. මගෙ යාළුවො සේරම මාළුවො වෙලා ඉඳලා තියෙන්නෙ
ඔහ්..මොනවා..
මගෙ යාළුවනේ ඔය ගොල්ලොයි එහෙනම් රාත්‍රියට මාළිගාව වටේ මුහුදට ඇවිත් සිංදු කියල තියෙන්නෙ..
ඔයගොල්ලො හැමදෙනාම මට මුණගැස්සුනු එකට මම දෙවියන් වහන්සේට ස්තූති කරනවා..
ඒ වැඩෙත්හරි.. මන්ත්‍රකාරිය එසේනම් තිගේ බලයෙන් කුමාරයයි පිරිසයි ආපු නැව
නැවතත් ඔවුනට ලබාදෙන්න..
මන්ත්‍රකාරිය එවරද වෙනත් මන්ත්‍රයක් මතුරා මන්ත්‍ර යෂ්ටිය උඩට එසවුවා.. එවිට මහ හඬක් නගාගෙන
ඩ්‍රා.........
කුමාරයා සහ පිරිස ආපු නෞකාව යථා තත්වයට පත්වී මුහුදු පතුලේ රැඳුනා.
මහා පුදුමයක්

ශු. ප්‍රැන්සිස් මුණිඳුන්ගේ

කතාව

# අසීසි නගරයේ දිළින්දා

ඉදිරිපත් කිරීම – ආමල් ද සිල්වා

08







